# වාර්ෂික වාර්තාව - 2019

# පටුන


| | | |
|---|---|---|
| 1. | වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබලැන්වීම | 5 |
| | දැක්ම | 6 |
| | මෙහෙවර | 6 |
| | උපායමාර්ගික ඉලක්ක | 6 |
| | ප්‍රධාන කාර්යයන් | 6 |
| | අපගේ අගයන් | 6 |
| | උපායමාර්ගික අභිලාෂය | 6 |
| | රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යංශයෙහි ලේකම් සහ ශ්‍රී.ලං.සං.පරි. ආයතනයෙහි පාලක සභාවෙහි සභාපතිවරයාගේ පණිවිඩය | 7 |
| | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය | 8 |
| 2. | මූල්‍ය අංශයෙහි කැපී පෙනුණ අවස්ථා | 9-12 |
| 3. | පාලක සභාවෙහි සාමාජිකයන් | 13 |
| 4. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය | 14 |
| | 4.1. අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 14 |
| | 4.2. සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු | 15 |
| 5. | කාර්ය සහ සංවිධාන ව්‍යුහය | 16 |
| | 5.1. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය | 16 |
| | 5.2. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන ව්‍යුහය | 17 |
| 06. | අධ්‍යක්ෂ ජනරාල් තුමන්ගේ සමාලෝචනය | 18 |
| | ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් - 2019 | 18 |
| | 6.1. සේවාරම්භක පුහුණු වැඩසටහන් | 18 |
| | 6.2. දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන පුහුණු වැඩසටහන් | 19 |
| | 6.4. ඩිප්ලෝමා වැඩසටහන් | 20 |
| | 6.5. කෙටි කාලීන ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් | 20 |
| | 6.6. රිසිකරණ ඉගෙනුම් සහ සංවර්ධන වැඩසටහන් | 21 |
| | 6.7. කළමනාකරණ උපදේශනය | 22 |
| 07. | පශ්චාත් උපාධි අධ්‍යයන පාසල | 23 |
| 08. | 2019 වසර තුළ පවත්වන ලද විභාග | 24-26 |
| 09. | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 26-29 |
| 10. | භාෂා අධ්‍යයන මධ්‍යස්ථානය | 30 |
| 11. | පොදු පරිපාලනය | 31 |
| | 11.1. සේවක සංඛ්‍යා කළමනාකරණය | 31 |
| | 11.2. මානව සම්පත් කළමනාකරණය | 31 |
| | 11.3. කාර්ය සම්පාදන කළමනාකරණය | 31-33 |
| 12. | 2019 වසරේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ අවස්ථා | 34 |
| | i. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ජනාධිපති පරිසර සම්මාන -2019 හි රිදී සම්මානය දිනාගන්නා ලදී. | 34 |
| | ii. ශ්‍රී ලංකා පරිපාලන සේවයට අලුතින් බඳවාගන්නා ලද නිලධාරීන් විසින් රචිත පොත් එළි දැක්වීම ඇගයීමට ලක්කිරීම. | 34 |
| | iii. කාර්ය මණ්ඩලයේ වර්ෂ අවසාන විශ්ලේෂණාත්මක සාකච්ඡාව - විවේකී හමුව (*Retreat*) 2019 | 35 |
| | iv. අප ආ ගමන් මග | 35 |
| | v. ශ්‍රී ලංකා පොලිසියේ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සඳහා කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 35 |
| | vi. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංවර්ධන නිළධාරීන් සඳහා රිසිකරණ පුහුණු වැඩසටහන | 36 |
| | vii. ප්‍රායෝගික භාවිතාව තුළ නායකත්වය යන මැයෙන් ප්‍රසිද්ධ දේශනය | 36 |
| | viii. ශ්‍රී ලංකා පරිපාපන සේවයට අලුතින් බඳවාගත් නිලධාරීන් සඳහා සමාජ ඒකාබද්ධතාව පිළිබඳ පදනම් පාඨමාලාව | 36 |
| | ix. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2018 | 37 |
| | x මෙරට පළමු වතාවට රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් සඳහා පරිපාලන නීතිය පිළිබඳ නවතම ඩිප්ලෝමා පාඨමාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හඳුන්වා දෙන ලදී. | 38 |
| | xi. පාකිස්ථානයේ පුහුණු වැඩසටහන | 39 |
| | xii. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා ඌව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේදී පවත්වන ලද බැහැරගත පුහුණුව | 39 |
| 13. | විගණන කමිටුවේ වාර්තාව | 40-50 |

## 01. වඩා යහපත් හෙට දිනක් උදෙසා රාජ්‍ය අංශය සවිබල ගැන්වීම

රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ සංස්ථාපිත ආයතනයක් වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (ශ්‍රී.ලං.සං.පරි.ආ) 1982 අංක 9 දරණ පණතින් 1982 මැයි මාසයේදී ස්ථාපිත කෙරිණි. එය රාජ්‍ය අංශයෙහි විධායක මට්ටමේ නිලධාරීන්ගේ වෘත්තීමය සංවර්ධනය සහ නිපුණතා වර්ධනය පිළිබඳ වගකීම පවරන ලද්දා වූ ප්‍රමුඛ ජාතික ආයතනය වේ.

පොදු යහපත උදෙසා වන හරයාත්මක වටිනාකම තුල ගත් කළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ප්‍රධානම ක්‍රියාකාරීත්ව අංශයන් වනුයේ රාජ්‍ය අංශයෙහි නිලධාරීන් හට පුහුණුව සැලසීම, රාජ්‍ය අංශයෙහි සංවිධාන වෙත කළමනාකරණ උපදේශනයන් සැපයීම, සහ රාජ්‍ය නිලධාරීන් පර්යේෂණයන් සඳහා දිරිගැන්වීමය.

තවද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් රාජ්‍ය කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සහ එම උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිළිගනු ලැබ ඇත. ඒ අනුව මෙම ආයතනය මගින් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ රාජ්‍ය කළමනාකරණපති උපාධි පාඨමාලා පවත්වමින් අදාල උපාධිය පිරිනමනු ලබයි.

රාජ්‍ය පරිපාලනය පිලිබඳ විෂයය භාර අමාත්‍යවරයා ගේ සමස්ත මගපෙන්වීම යටතේ ආයතනයෙහි ප්‍රතිපත්ති තීරණය කිරීමෙහිලා වන වගකීම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාව විසින් දරනු ලබයි.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පුහුණුව සහ පර්යේෂණ සඳහා සහය දක්වන ලන්ඩන් සිවිල් සේවා විද්‍යායතනය, සිංගප්පූරු සිවිල් සේවා විද්‍යායතනය, චීනයෙහි බීජිං විදෙස් අධ්‍යයන සරසවිය, ඉන්දියාවෙහි පරිපාලනය පිලිබඳ ලාල් බහදූර් ශාස්ත්‍රී ජාතික ඇකඩමිය, ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවිය, මාලදිවයින්හී සිවිල් සේවා පුහුණු ආයතනය, චීනයෙහි හුවාසොන්ග් විද්‍යා සහ තාක්ෂණ සරසවිය වැනි විදෙස් සරසවි සහ පුහුණු ආයතනයන් කිහිපයක් සමග ජාලගතව කටයුතු කරයි. 2018 වසර තුළදී ද්වීපාර්ශවික පුහුණු සහ පර්යේෂණ සහයෝගීතාවන් පවත්වාගැනීම උදෙසා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පහත සඳහන් ආයතන සමග අවබෝධතා ගිවිසුමකට ඇතුලත් විණි.

- පකිස්ථාන ඉස්ලාමික ජනරජයෙහි රාජ්‍ය ප්‍රතිපත්ති පිලිබඳ ජාතික විද්‍යායතනය
- ඉන්දියාවෙහි හයිද්‍රාබාද්හී රාජ්‍ය ව්‍යවසායකත්ව ආයතනය

ගෙවී ගිය වසර 36 ක කාල පරිච්ඡේදය තුළ දැනුම් වර්ධනය, කුසලතා වර්ධනය, සහ සංවිධානමය සංවර්ධනය සහ පර්යේෂණ පැවැත්වීම යන අංශයන් ඇතුළුව විස්තීර්ණ වූ පරාසයක් තුළ සේවා සම්පාදනයෙහි නිරත වෙමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය රාජ්‍ය සේවයේ ප්‍රමුඛතම පුහුණු ආයතනයක් බවට පරිවර්තනය වී තිබේ.

## දැක්ම

**" රාජ්‍ය අංශයේ ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාවලියෙහි ආසියාවේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත්වීම."**

## මෙහෙවර

**ඉගෙනුම හා සංවර්ධනය, උපදේශන සේවා සහ පර්යේෂණ මගින් නිර්මාණශීලී,
අනාගත දැක්මක් සහිත හා පුරවැසි කේන්ද්‍රගත රාජ්‍ය සේවාවක් සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා
පහසුකම් සැලසීම**

## උපායමාර්ගික ඉලක්ක

- වඩාත් ක්‍රියාශීලි හා ඵලදායී රාජ්‍ය සේවාවක් නිර්මාණය කිරීමේ ජාතික සංවර්ධන පරමාර්ථයට දායක වීම.
- ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සංවර්ධනයට දායකත්වය සැපයීමේ ප්‍රධාන හවුල්කරුවකු වීම.
- සංවර්ධන පරිපාලන ආයතනය පිළිබඳව එහි පාර්ශවකරුවන් අතර ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැංවීමත් එතුළින් එහි ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් සඳහා ඉල්ලුම ඉහළ නැංවීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දකුණු සහ ගිණිකොණ දිග ආසියාවේ රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණ සංවර්ධනය පිළිබඳ සහයෝගීතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය අංශයේ කළමනාකාර නිළධාරීන්ගේ ධාරිතාවය ගොඩනැංවීම සඳහා ඉගෙනුම් ක්‍රියාවලිය හා වැඩසටහන් සැකසීම.
- පශ්චාත් උපාධි වැඩසටහන් මගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම.
- රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමානකරණය පිළිබඳ අරමුණු සහගත පර්යේෂණ තැන්පතුවක් පවත්වාගෙන යාම.
- රාජ්‍ය අංශයේ ආයතන හා රජය සතු ව්‍යවසායන්හි ඵලදායීතාව හා කාර්යක්ෂමතාව නංවාලීම සඳහා සංවිධාන සංවර්ධන සේවාවන් පැවැත්වීම.
- රාජ්‍ය අංශය සඳහා කාර්යක්ෂමතා කඩඉම් හා භාෂා පරීක්ෂණ පැවැත්වීම.

## අපගේ අගයන්

විශිෂ්ඨත්වය, කැපවීම, අසමානත්වය, වගවීම, තිරසරභාවය

## උපායමාර්ගික අභිලාෂය

'' වඩා හොඳ අනාගත ශ්‍රී ලංකාවක් සඳහා රාජ්‍ය අංශය සවි බලගැන්වීම.''

## රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ අමාත්‍යංශයෙහි ලේකම් සහ ශ්‍රී.ලං.සං.පරි. ආයතනයෙහි පාලක සභාවෙහි සභාපතිවරයාගේ පණිවිඩය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි 2019 වසර උදෙසා වන වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය එකතු කරන්නට ලැබීම පිළිබඳ මම අතිශය සතුටට පත්වෙමි. ධාරිතා සංවර්ධන සහ සැලසුම්ගත වාර්ෂික වැඩසටහන් ඇතුළු වෙනත් වැඩසටහන් 150 කට අමතරව මෙම අමාත්‍යංශය විසින් පවරන ලද සේවාරම්භක පුහුණු වැඩසටහන් 11 ක්ද වශයෙන් වසරක් තුළ පැවැත්වීමට සිදුවන විශාල වැඩසටහන් සංඛ්‍යාවක් සාර්ථක අන්දමින් පැවැත්වූ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට මෙම වසර ඉතා අභියෝගාත්මක වසරක් වූ බව මම නිරීක්ෂණය කරමි. ආයතනයට නිල වශයෙන් පැවරී ඇති කාර්යයන්හි අංගයක් වශයෙන් රාජ්‍ය අංශයේ අනෙකුත් ආයතන වෙත කළමනාකරණ උපදේශන සේවා සැපයීමද සිදු කරමින් අදාළ ආයතන මගින් මහජනතාව වෙත සැපයෙන සේවාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහාද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දායකත්වය සැපයීය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ප්‍රධාන වශයෙන් කටයුතු කරන්නේ රාජ්‍ය අංශයේ කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගේ අවශ්‍යතා සැපිරීමට වුවද මෙම අමාත්‍යංශයේ ඉල්ලීම පරිදි ග්‍රාම නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් 111 ක් සඳහා කේරල රජයේ කළමනාකරණ ආයතනයෙහිදී විදේශ අත්දැකීම් ලබාගැනීමේ අවස්ථාවක්ද සමගින් ධාරිතා සංවර්ධන වැඩසටහනක් එමගින් පවත්වා තිබීම සැලකිල්ලට ගත යුතු කාරණයකි. අපගේ රටට සමාන අන්දමින් සමාජ ආර්ථික ජයග්‍රහණ අත් කරගෙන ඇති විදේශ පරිසරයක් තුළදී ගම් මට්ටමේ සංවර්ධනයේදී යොදා ගැනෙන හොඳම භාවිතයන් තුළින් ඉගෙනගැනීමටත් අත්දැකීම් හුවමාරු කරගැනීමටත් එමගින් ඔවුන්ට අවස්ථාව ලැබුණි. දිගු කලක පටන් රාජ්‍ය අංශයේ පැවැති අවශ්‍යතාවක් සපුරාලමින්, රාජ්‍ය නිලධාරීන්ට පරිපාලනයට අදාළව අත්‍යවශ්‍ය වන නෛතික දැනුම බෙදා දීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2019 ඔක්තෝම්බර් මාසයේදී රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් සඳහා පරිපාලන නීතිය නමින් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මහත් කැපවීමෙන් ඉටු කරනු ලබන සේවයට යෝග්‍ය වන පරිදි 2019 ඔක්තෝම්බර් මාසයේදී 2019 ජනාධිපති පරිසර සම්මානයත් (රිදී සම්මානය) ඵලදායිතා සම්මානයත් (තෙවන ස්ථානය) ජයග්‍රහණය කිරීම පිළිබඳ මම සතුටට පත්වෙමි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය එවැනි ජාතික මට්ටමේ පිළිග ැනීමකට පාත්‍ර වන අන්දමින් ඉහළට ගෙන යාම පිළිබඳ එහි කාර්ය මණ්ඩලයට මම සුබ පතමි.

ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ලබාදෙන වටිනා මග පෙන්වීම සහ උපදෙස් වෙනුවෙන් ගරු අමාත්‍යවරයා සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලක සභාවේ සාමාජිකයින් වෙත ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමිග ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලයට මාගේ සුබ පැතුම් පිරිනමමි.

**ජේ.ජේ.රත්නසිරි**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය**
**සභාපති, පාලක සභාව**

## අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය

පෙර වසරවලට සාපේක්ෂව අප විසින් වැඩිම පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පවත්වන ලද 2019 වසර උදෙසා වන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාවට මෙම කෙටි පණිවිඩය එකතු කරන්නට ලැබීම පිළිබඳ මම අතිශයින් සතුටට පත්වෙමි. අප රටෙහි කළමනාකරණ මට්ටමේ රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සඳහා පවතින ප්‍රමුඛතම ආයතනය වශයෙන්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මෙම වසර තුළදී නිලධාරීන් 3014 ක් උදෙසා වැඩසටහන් 70 ක් සාර්ථකව පැවැත්වීමට සමත් වුණි.

සමාලෝචිත වර්ෂය තුළදී, ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත), ශ්‍රී ලංකා පරිපාලන සේවය (සීමිත), ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (විවෘත), ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (සීමිත), ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (විවෘත), ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (සීමිත), පරිපාලන නිලධාරී (විවෘත) සහ පරිපාලන නිලධාරී (සීමිත) යන සේවාවන්ට අයත් අලුතින් බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් 11 ක් පැවැත්වීමට අප වෙත පැවරුණු අතර ඒවාට නිලධාරීන් 1159 දෙනෙක් සහභාගී වූහ. ඇතැම් වැඩසටහන් එකවර පැවැත්වීමට සිදු වීම හේතුවෙන්, පවතින කාර්ය මණ්ඩලය, පන්ති කාමර, නවාතැන් පහසුකම් සහ ආහාර ගැනීමේ පහසුකම් ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීමට සිදුවිය. මෙම අභියෝගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය මහත් කැපවීමෙන් යුතුව ලබාදුන් සහයෝගය හේතුවෙන් ජය ගත හැකි විය. ඔවුහු ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව ආයතන පරිශ්‍රයේ ඇතැම් ස්ථාන පන්ති කාමර බවට පත් කිරීමටත් ආපනශාලාව සඳහා ආහාර ගැනීමට තාවකාලික ශාලාවක් ඉදිකිරීමටත් සමත් වූහ. ඔවුන්ගේ සහයෝගය නොවන්නට එම කාර්යය සඳහා අධික වියදමක් දරන්නට සිදුවනු ඇත. එවැනි ප්‍රශංසනීය කණ්ඩායම් හැඟීමක් කාර්ය මණ්ඩල සාමාජිකයින් තුළ තිබීම පිළිබඳ මම කෘතවේදී වෙමි.

2019 මාර්තු මාසයේදී ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී නිෂ්පාදන හා සේවා කාණ්ඩය යටතේ 3 වන ස්ථානය දිනා ගැනීමට අප සමත් වීම අපට මහත් අභිමානයකි. එමෙන්ම 2019 ජනාධිපති පරිසර සම්මාන උළෙලේ රාජ්‍ය ආයතන කාණ්ඩය යටතේ සාඩම්බර රිදී සම්මාන ජයග්‍රාහකයා බවටද අපි පත්වීමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවයට අලුතින් බඳවාගන්නා ලද නිලධාරීන් කිහිප දෙනෙක් විසින් රචිත ග්‍රන්ථ කිහිපයක් ඔවුන්ගේ සේවාරම්භක පුහුණුව තුළදී එළි දැක්වීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දිරි ගැන්වීම සිදු කළ බව සඳහන් කළ යුතුය. එම උත්සවයේ ආරාධිත දේශනය පැවැත්වූ සම්මානනීය ලේඛිකා සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය එම නිලධාරීන්ගේ ලේඛන කුසලතා ඇගයීමට ලක් කළාය. අපගේ අරමුණ වූයේ රාජ්‍ය සේවයේ නියැලෙමින් සිටියදීම ජනතාවගේ බුද්ධිමය හා සංස්කෘතික ජීවිතය සාරවත් කිරීම සඳහා දායකවීමට හැකි වන අන්දමින් රාජ්‍ය සේවක නව පරම්පරාව ඔවුන්ගේ කියවීමේ හා ලේඛන කුසලතා වඩාත් ඉහළ මට්ටමකට සංවර්ධනය කර ගැනීම සඳහා දිරි ගැන්වීමයිග තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල එහි රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ නව කණ්ඩායමේ අධ්‍යයන කටයුතු 2019 පෙබරවාරි මාසයේදී ආරම්භ කළ අතර එයට 78 ක් දෙනෙක් ලියාපදිංචි වූහ. එමෙන්ම එම වසරේ ජූනි මාසයේදී පවත්වන ලද උපාධි ප්‍රදානෝත්සවයේදී රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගත් උපාධිධාරීන් ගණන 174 කි.

අවසාන වශයෙන්, මේ සියලු ජයග්‍රහණ වෙනුවෙන් ගරු අමාත්‍යවරයා සහ පාලක සභාවේ සභාපති හා සාමාජිකයින් ලබාදුන් මග පෙන්වීම හා උපදෙස් සම්බන්ධයෙන් මාගේ කෘතවේදීත්වය ඔවුන් වෙත පුද කර සිටිමි. එම සාර්ථකත්වය අත් කර ගැනීම සඳහා වෙහෙස නොබලා කටයුතු කළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලයේ කැපවීමද මම බෙහෙවින් අගය කරමි.

**කේ.එම්.එස්.ඩී.ජයසේකර**
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)**

## 2. මූල්‍ය අංශයෙහි කැපී පෙනුණ අවස්ථා

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**
**2019 දෙසැම්බර් 31 වන දිනට**

| | සටහන් | 2019<br>රු. ශ. | 2018<br>රු. ශ. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| බැංකු ශේෂ | 03 | 22,918,072.02 | 72,042,623.13 |
| තැන්පත් නොකළ ලැබීම් | | - | 525,555.04 |
| තෙමස් තැන්පතු | 04 | 302,291,319.34 | 290,170,307.53 |
| ලැබීම් | 05 | 22,058,329.11 | 29,937,094.12 |
| අතැති තොගය | 06 | 5,861,336.98 | 4,518,286.49 |
| පූර්ව ගෙවීම් | 07 | 3,480,761.33 | 3,429,902.43 |
| අත්තිකාරම් | 08 | 293,340.64 | 1,940,973.56 |
| කාර්ය මණ්ඩල ණය | 09 | 16,059,835.13 | 15,432,939.82 |
| | | **372,962,994.55** | **417,997,682.12** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 421,105,571.58 | 430,251,113.63 |
| කෙරීගෙන යන වැඩ (ප්‍රාග්ධනය) | | 1,644,343.69 | - |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | 11 | 38,081,659.54 | 34,776,276.63 |
| තැන්පතු ගිණුම | 12 | 1,299,500.00 | 1,299,500.00 |
| | | 462,131,074.81 | 466,326,890.26 |
| **මුළු වත්කම්** | | **835,094,069.36** | **884,324,572.38** |
| **බැරකම්** | | | |
| ජංගම බැරකම් | | | |
| ගෙවිය හැකි තැන්පතු | 13 | 21,812,011.68 | 49,422,542.51 |
| කල් තබා ලැබීම් | 14 | 105,846,522.47 | 93,686,228.51 |
| උපචිත වියදම් | 15 | 3,115,638.71 | 25,431,601.95 |
| අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනය | | 4,322,607.91 | 3,669,302.08 |
| | | **135,096,780.77** | **172,209,675.05** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | 16 | 21,515,765.39 | 23,170,823.72 |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | 17 | 32,939,816.50 | 29,614,322.20 |
| | | **54,455,581.89** | **52,785,145.92** |
| **මුළු බැරකම්** | | **189,552,362.66** | **224,994,820.97** |
| **ශුද්ධ වත්කම්** | | **645,541,706.70** | **659,329,751.41** |
| **ශුද්ධ වත්කම්රැසම කොටස්** | | | |
| විලම්බිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදානය | | 564,544,388.88 | 595,232,238.83 |
| අනෙකුත් සංචිත - වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | 18 | 12,015,807.00 | 12,015,807.00 |
| සමුච්චිත අතිරික්තය /හිඟය | 19 | 68,981,510.82 | 52,081,705.58 |
| **මුළු ශුද්ධ වත්කම්/සම කොටස්** | | **645,541,706.70** | **659,329,751.41** |

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
**2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2019 | 2018 |
|---|---|---|---|
| | | රු.ශ. | රු.ශ. |
| **ආදායම** | | | |
| භාණ්ඩාගාරයේ දායකත්වය | 20 | 168,977,849.95 | 133,612,634.37 |
| **අනෙකුත් ආදායම** | | | |
| පාඨමාලා ගාස්තු | 21 | 155,740.00 | 1,571,500.00 |
| ශාලා කුලියට දීම | | 21,975,030.00 | 18,553,241.50 |
| ප්‍රකාශන අලෙවිය | | 98,932.00 | 434,654.50 |
| ආයෝජන මත ආදායම | 22 | 31,718,528.53 | 31,856,460.09 |
| ණය පොලී | | 664,924.88 | 667,962.13 |
| කුලී | 23 | 13,658,393.83 | 16,405,920.17 |
| බදු කුලී | | 1,655,058.33 | 1,655,058.83 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පාසල | | 9,945,276.58 | 17,487,414.44 |
| භාෂා වැඩසටහන | | 1,162,445.75 | 10,875,500.00 |
| උපදේශක සේවා | 24 | 51,648,093.20 | 33,805,397.26 |
| ආයතනික කොටස් ආදායම | | 10,356,757.41 | 16,782,713.75 |
| විවිධ ආදායම් | 25 | 16,113,053.31 | 18,631,860.82 |
| **මුළු ආදායම** | | **328,130,083.77** | **302,340,317.86** |
| **වියදම්** | | | |
| පුද්ගලික වේතන | 26 | 108,954,116.89 | 100,923,950.47 |
| කාර්ය මණ්ඩල සුබ සාධනය | 27 | 4,136,515.72 | 3,869,863.80 |
| ප්‍රවාහන උපවේශන සහ දීමනා | 28 | 1,099,719.02 | 4,393,844.63 |
| උපයෝගීතාව සහ අනෙකුත් සේවා | 29 | 34,919,536.08 | 36,630,134.29 |
| ප්‍රවාහනය | 30 | 3,132,607.90 | 3,913,840.52 |
| ස්ථාවර වත්කම් අලුත්වැඩියාව සහ නඩත්තුව | 31 | 4,480,273.43 | 5,459,151.92 |
| සැපයුම් සහ අවශ්‍යතා | 32 | 9,178,130.49 | 9,493,108.15 |
| මූල්‍යමය ගාස්තු | 33 | 3,191,853.99 | 3,609,061.04 |
| පුස්තකාල සේවා | 34 | 344,093.50 | 431,271.50 |
| පුහුණු හා ඇගයුම | 35 | 1,181,402.21 | 1,756,600.85 |
| ප්‍රකාශන සහ තොරතුරු සේවා | 36 | 316,800.00 | 0.00 |
| විදේශ පුහුණු සහ අධ්‍යයන චාරිකා | 36-A | 32,007,008.68 | 59,111,650.38 |
| ක්ෂය වීම් | 37 | 37,245,423.64 | 39,720,093.64 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පාසල | 38 | 8,961,528.54 | 7,793,566.08 |
| ඉංග්‍රීසි භාෂා වැඩසටහන | 39 | 2,386,103.58 | 3,916,965.00 |
| උපදේශක සේවා | 40 | 51,648,093.20 | 33,805,397.36 |
| පාරිතෝෂික ප්‍රතිපාදනය | | 4,475,874.30 | 3,223,949.00 |
| අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනය | | 653,305.83 | 447,852.08 |
| ප්‍රකාශන වියදම් | | 0.00 | 268,498.50 |
| **මුළු වියදම්** | | **308,312,387.00** | **318,768,799.21** |
| **කාල සීමාව සඳහා අතිරික්තය රු. (හිඟය)** | | **19,817,696.77** | **(16,428,481.35)** |

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
**2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය**

| | 2019 | 2018 |
|---|---|---|
| | රු.ශ. | රු.ශ. |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / හිඟය** | **19,817,696.77** | **(16,428,481.35)** |
| අරමුදල් සංචලනය කෙරෙහි බලපෑමක් නොමැති අයිතම සඳහා ගැළපුම | | |
| ක්ෂයවීම් | 37,245,423.64 | 39,720,093.64 |
| ක්‍රමක්ෂය | (30,687,849.95) | (31,602,634.37) |
| පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදනය | 4,475,874.30 | 3,223,949.00 |
| අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනය | 653,305.83 | 447,852.08 |
| පෙර වර්ෂයට අදාළ ගැළපුම | (2,917,891.53) | (8,937,954.25) |
| බැහැර කිරීම | 0.00 | 0.00 |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)** | **28,586,559.06** | **(13,577,175.25)** |
| තොග අඩුවීම්වල අඩුවීම් (වැඩිවීම්) | (1,343,050.50) | (1,420,707.02) |
| අත්තිකාරම් අඩුවීම්වල (වැඩිවීම්) | 1,647,632.92 | 3,774,146.78 |
| පූර්ව ගෙවීම් අඩුවීම්වල (වැඩිවීම්) | 50,858.90 | 1,501,914.54 |
| කාර්ය මණ්ඩල සඳහා ණය අඩුවීම්වල (වැඩිවීම්) | (626,895.30) | (396,146.48) |
| ලැබිය යුතු දේ අඩුවීම්වල (වැඩිවීම්) | 7,878,765.01 | 6,863,601.42 |
| තැන්පත් කළ ලැබීම් වැඩිවීම්වල (වැඩිවීම්) | | (405,178.54) |
| ගෙවිය යුතු තැන්පතු වැඩිවීම්වල (අඩුවීම්) | (27,619,569.16) | 26,270,646.14 |
| උපචිත වියදම් වැඩිවීම්වල (අඩුවීම්) | (22,315,963.24) | 5,445,948.95 |
| කෙරී ගෙන යන වැඩ වැඩිවීම්වල (අඩුවීම්) | (1,644,343.69) | |
| උපදේශක සේවාවල (අඩුවීම්) | 12,160,293.96 | 14,265,026.68 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(31,812,271.10)** | **55,899,252.47** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | |
| ගොඩනැගිලි අත්කර ගැනීම | (12,587,715.08) | (22,604,893.70) |
| ගෘහභාණ්ඩ සහ සවිකුරු අත්කර ගැනීම | (3,577,769.79) | (10,557,267.55) |
| කාර්යාලීය උපකරණ අත්කර ගැනීම | (2,854,481.65) | (5,584,337.92) |
| විදුලි තිරවුරු අත්කර ගැනීම | (4,425,536.40) | (5,134,045.18) |
| පරිගනක අත්කර ගැනීම | (2,810,489.80) | (5,868,750.00) |
| මෘදුකාංග පැකේජ අත්කර ගැනීම | 0.00 | (2,940,695.75) |
| පොත් අත්කර ගැනීම | (712,063.30) | (953,865.93) |
| අනෙකුත් වත්කම් අත්කර ගැනීම | (1,224,498.54) | (3,900,029.50) |
| ගෙවන ලද පාරිතෝෂිකය | (1,150,386.00) | (2,603,633.00) |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනය | (3,305,382.91) | (3,184,709.21) |
| කෙටි කාලීන තැන්පතු | (12,121,011.81) | (22,124,119.52) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 0.00 |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(44,769,335.28)** | **(85,456,347.26)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 0.00 | 112,780,000.00 |
| දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ වැඩිවීම (අඩුවීම) | (1,655,058.83) | (1,655,058.83) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(1,655,058.83)** | **111,124,941.17** |
| | | |
| මුදල් හා මුදල් සමතුලනයන්හි ශුද්ධ වර්ධනය / (අඩුවීම) | (49,650,106.15) | 67,990,671.12 |
| කාල සීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමතුලනයන් | 72,568,178.17 | 4,051,952.01 |
| **කාල සීමාව අවසානයේදී මුදල් හා මුදල් සමතුලනයන්** | **22,918,072,02** | **72,042,623.13** |

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
**2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සහ 2019 වසර සඳහා**
**ශුද්ධ වත්කම්රැසම කොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**

| | **පාලන අස්තිත්වයේ හිමිකරුවන්ට අදාළ වන** | | | |
|---|---|---|---|---|
| | **දායක ප්‍රාග්ධනය** | **අනෙකුත් සංචිත** | **සමුච්චිත අතිරික්ත/ (හිඟ)** | **මුළු ශුද්ධ වත්කම් / සම කොටස්** |
| | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. |
| 2018 ජනවාරි 01 වන දිනට ශේෂය | 514,054,873.20 | 12,015,807.00 | 77,448,141.18 | 603,518,821.38 |
| **ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම | | | | |
| පෙර වර්ෂයට අදාළ ගැළපීම් | | | (8,937,954.25) | (8,937,954.25) |
| නැවත ප්‍රකාශ කරන ලද ශේෂය | **514,054,873.20** | **12,015,807.00** | **68,510,186.93** | **594,580,867.13** |
| **2018 වසර සඳහා ශුද්ධ වත්කම් රැසම කොටස් වෙනස්වීම** | | | | |
| භාණ්ඩාගාරය වෙතින් ලද දායකත්වය - ප්‍රාග්ධනය | 112,780,000.00 | | | 112,780,000.00 |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | (31,602,634.37) | | | (31,602,634.37) |
| කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය | | | (16,428,481.35) | |
| **ඉදිරියට ගෙනෙන ලද 2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **595,232,238.83** | **12,015,807.00** | **52,081,705.58** | **675,758,232.76** |
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | 595,232,238.83 | 12,015,807.00 | 52,081,705.58 | 659,329,751.41 |
| **ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම | | | | |
| | - | | | |
| පෙර වර්ෂයට අදාළ ගැළපීම් | | | **(2,917,891.53)** | **(2,917,891.53)** |
| **නැවත ප්‍රකාශ කරන ලද ශේෂය** | **595,232,238.83** | **12,015,807.00** | **49,163,814.05** | **656,411,859.88** |
| **2019 වසර සඳහා ශුද්ධ වත්කම් / සම කොටස් වෙනස්වීම** | | | | |
| භාණ්ඩාගාරය වෙතින් ලද දායකත්වය - ප්‍රාග්ධනය | - | | | |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | (30,687,849.95) | | | (30,687,849.95) |
| කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය | | | 19,817,696.77 | 19,817,696.77 |
| **ඉදිරියට ගෙනෙන ලද 2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **564,544,388.88** | **12,015,807.00** | **68,981,510.82** | **645,541,706.70** |

| | **පාලන අස්තිත්වයේ හිමිකරුවන්ට අදාළ වන** | | | |
|---|---|---|---|---|
| | **දායක ප්‍රාග්ධනය** | **අනෙකුත් සංචිත** | **සමුච්චිත අතිරික්ත/ (හිඟ)** | **මුළු ශුද්ධ වත්කම් / සම කොටස්** |
| | රු.ශ. | රු.ශ. | රු.ශ. | රු.ශ. |
| **2017 ජනවාරි 01 වන දිනට ශේෂය** | 478,753,816.81 | 12,015,807.00 | 64,779,745.20 | 555,549,369.01 |
| **ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම | | | | |
| පෙර වර්ෂයට අදාළ ගැළපීම් | | | (3,372,257.53) | (3,372,257.53) |
| නැවත ප්‍රකාශ කරන ලද ශේෂය | 478,753,816.81 | 12,015,807.00 | 61,407,487.67 | 552,177,111.48 |
| **2017 වසර සඳහා ශුද්ධ වත්කම් රැසම කොටස් වෙනස්වීම** | | | | |
| භාණ්ඩාගාරය වෙතින් ලද දායකත්වය - ප්‍රාග්ධනය | 62,950,000.00 | - | - | 62,950,000.00 |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | (27,648,943.61* | | | (27,648,943.61) |
| කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය | - | - | 16,040,653.51 | 16,040,653.51 |
| **ඉදිරියට ගෙනෙන ලද 2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **514,054,873.20** | **12,015,807.00** | **77,448,141.18** | **603,518,821.38** |
| **2018 ජනවාරි 01 වන දිනට ශේෂය** | **514,054,873.20** | **12,015,807.00** | **77,448,141.18** | **603,518,821.38** |
| **ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම | | | | - |
| පෙර වර්ෂයට අදාළ ගැළපීම් | | | (11,536,551,39) | (11,536,551.39) |
| නැවත ප්‍රකාශ කරන ලද ශේෂය | **514,054,873.20** | **12,015,807ග00** | **65,911,589,79** | **591,982,269.99** |
| **2018 වසර සඳහා ශුද්ධ වත්කම් රැසම කොටස් වෙනස්වීම** | | | | |
| භාණ්ඩාගාරය වෙතින් ලද දායකත්වය - ප්‍රාග්ධනය | | | | |
| විලම්භිත ආදායම ක්‍රමක්ෂය | | | | |
| කාල සීමාව සඳහා අතිරික්තය / හිඟය | | | | |
| **ඉදිරියට ගෙනෙන ලද 2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **514,054,873.20** | **12,015,807.00** | **65,911,589.79** | **591,982,269.99** |

## 3. පාලක සභාවෙහි සාමාජිකයන්

1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පණතෙහි 6 (1) වගන්තිය ප්‍රකාරව ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍යවරයා විසින් පහත සඳහන් මහත්ම මහත්මීන් 2019 වසර සඳහා ආයතනයේ පාලක සභා සාමාජිකයන් ලෙස පත් කරන ලදී.

| | | |
|---|---|---|
| **ජේ.ජේ.රත්නසිරි මහතා**<br>ලේකම්<br>රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමණාකරන අමාත්‍යාංශය | - | **සභාපති**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **සමන් ඒකනායක මහතා**<br>අග්‍රාමාත්‍ය ලේකම්<br>අග්‍රාමාත්‍ය කාර්යාලය | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **එම්.එම්.පී.කේ.මායාදුන්නේ මහතා**<br>ලේකම්,<br>නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශය | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **එච්.ටී.කමල් පත්මසිරි මහතා**<br>ලේකම්,<br>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු,<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **එච්.එම්.ගාමිණී සෙනෙවිරත්න මහතා**<br>ලේකම්,<br>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු,<br>පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **ගාමිණී කේ.බී.රත්නායක** | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **පී.බී.එස්.සී.නෝනිස් මහතා**<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **ඩී.ඒ. විජිත මහේන්ද්‍ර රත්නසේකර මහතා** | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **ඩී.ඒ. විජිත් මහේන්ද්‍ර රත්නසේකර මහතා** | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **එස්. සුරේෂ් සී. ප්‍රනාන්දු මහතා** | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **කීර්ති බණ්ඩාර කොටගමගේ මහතා**<br>ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |
| **කේ.එම්.එස්.ඩී.ජයසේකර මෙය**<br>ශ්‍රී.ලං.සං.පරි. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) | - | **සාමාජික**<br>(2019.02.28 සිට 2019.10.29 දක්වා) |

## 4. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය

**කේ.එම්.එස්.ඩී.ජයසේකර මෙය**
**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) (2018.09.28 සිට 2019.12.31 දක්වා)**
**අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉගෙනුම් සහ සංවර්ධන)**
ශ්‍රී.ලං.ප.සේ විශේෂ ශ්‍රේණිය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය,
කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
උපාය මාර්ගික මානව සම්පත් කළමණාකරනය පිළිබඳ
පශ්චාත් උපාධිය, වික්ටෝරියා විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව
කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාව PIM,
ශ්‍රී ලංකාව
විද්‍යාවේදී (ජීව විද්‍යා) උපාධිය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව

**පී.ඩබ්. රාජපක්ෂ මිය**
**අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන සහ මූල්‍ය)**
**(2019.01.01 සිට 2019.09.03 දක්වා)**
ශ්‍රී.ලං.ප.සේ විශේෂ ශ්‍රේණිය
ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, මොනෑෂ් විශ්ව විද්‍යාලය,
ඔස්ට්‍රේලියාව
කළමණාකරනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව,
(Merit Pass), ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ
බණ්ඩාරනායක මධ්‍යස්ථානය
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (විශේෂ) උපාධිය
(දෙවන පෙළ පහල සමත්) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ශ්‍රී ලංකාව

**ජේ.එස්.පී.පියසේන මහතා**
**අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - වැඩබලන (පරිපාලන සහ මූල්‍ය)**
**2019.11.01 සිට**
**අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ සහ වැඩසටහන් ප්‍රවර්ධන)**
**ශ්‍රීලංපසේ (I ශ්‍රේණිය)**
සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, කැලණිය විශ්වවිද්‍යාලය,
ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

**ආචාර්ය එස්. ආර්. එස්. එන්. සුදසිංහ**
**වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (PGDS) 2019.11.01 සිට**
**ජ්‍යෙෂ්ඨ උපදේශක, අධ්‍යයන සමායෝජක -**
**පශ්චාත් උපාධි අධ්‍යයන පාසල**
සංවර්ධන පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය, (රාජ්‍ය ප්‍රතිපත්ති
කළමණාකරනය පිළිබඳ විශේෂ),
විද්‍යාපති (ආර්ථික විද්‍යා), කොළඹ විශ්ව විද්‍යාලය,
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
(කොළඹ විශ්ව විද්‍යාලය),
ශාස්ත්‍රවේදී (ගෞරව) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

### 4.1 අභ්‍යන්තර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර

**එන්.ජේ.ජයසුන්දර මිය**
**ජ්‍යෙෂ්ඨ උපදේශිකා**
විද්‍යාපති (පරිසර ආර්ථික) PGIA පේරාදෙණිය
විද්‍යාවේදී කෘෂිකර්ම (ගෞරව) උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පරිසර කළමණාකරනය පිළිබඳ වෘත්තීය සහතිකය (CDG. ජර්මනිය)

**ඩබ්. එම්. එම්.ජී. ඩී. විජේකෝන් මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
විද්‍යාපති (නාගරික පරිසර කළමණාකරනය), AIT – තායිලන්තය
ශාස්ත්‍රවේදී (ගෞරව), භූගෝල විද්‍යාව, කොළඹ විශ්ව විද්‍යාලය

**ඒ ලොකුගමගේ මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
ශ්‍රී ලං ග සේ (1 ශ්‍රේණිය)
ශාස්ත්‍රපති (මූල්‍ය ආර්ථික විද්‍යාව) කොළඹ විශ්ව විද්‍යාලයල පශ්චාත් උපාධි
ඩිප්ලෝමාව (ආර්ථික සංවර්ධනය)
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සංස්ථාපිත සහ උපාය මාර්ගික මූල්‍යනය)
HNDA, DPFM, DIPPCA, Dip in IT, MAAT

**ආර්. දිසානායක මිය - නීතීඥ**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)
දිවුරුම් කොමසාරිස්
විද්‍යාපති රාජ්‍ය කළමණාකරන (ව්‍යාපෘති කළමණාකරන)
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
නීතිවේදී, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී (ගෞරව), කැළණිය විශ්ව විද්‍යාලය
DIPPCA.

**කේ.ඩී.ටී.එන්. අබේවර්ධන මෙය**
**ජ්‍යෙෂ්ඨ උපදේශිකා**
ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)
ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ පශ්චාත් උපාධිය, ICU, ටෝකියෝ, ජපානය
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පරිසර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ඉ - පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවල PIM,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
විද්‍යාවේදී සත්ව විද්‍යා (විශේෂ) උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලං සං පරි ආ

**කේ. ආර්. ගංගාධාර මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
2019.11.01 වන දින සිට වැඩ බලන අධ්‍යක්ෂ (පරිපාලන)
ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)
ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය
(ANU, ඔස්ට්‍රේලියාව)
ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි
ඩිප්ලෝමාව (ANU, ඔස්ට්‍රේලියාව)
විද්‍යාවේදී භූවිද්‍යා උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
රාජ්‍ය පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී ලං සං පරි ආ.

**එස්. ඩී. එන්. යූ. සේනාධීර මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක (2018.07.12 සිට)**
**ශ්‍රී ලං ප සේ (විශේෂ ශ්‍රේණිය)**
රාජ්‍ය පරිපාලන පශ්චාත් උපාධිය, ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය, ඇඩිලේඩ්, ඕස්ට්‍රේලියාව
වාග් විද්‍යා පශ්චාත් උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රවේදී උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

**කේ. ප්‍රසන්න චන්දිත් මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක**
**ශ්‍රී ලං ප සේ (විශේෂ ශ්‍රේණිය)**
ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය, රජරට විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
තිරසර සංවර්ධනය උදෙසා අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව, Uppasala විශ්ව විද්‍යාලය, ස්වීඩනය, රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව (ස්වීඩනය)

**ශාන්ත වීරසිංහ මහතා**
**ජ්‍යෙෂ්ඨ උපදේශක (2019.12.02 සිට)**
**ශ්‍රී ලං ප සේ (1 ශ්‍රේණිය)**
සංවිධාන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්වවිද්‍යාලය
ඉ - පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවල කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
විද්‍යාවේදී උපාධියල කැළණිය විශ්වවිද්‍යාලය
රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව, ශ්‍රී සං පරි ආ
ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවල ශ්‍රී සං පරි ආ

**එන්. එම්. එස්. ඒ. බණ්ඩාර මහතා**
**උපදේශක**
තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වනවිද්‍යා විද්‍යාපති උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

**එම්. පෙරේරා මහතා**
**සහය උපදේශක**
කෘත්‍රිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්ව විද්‍යාලය
තොරතුරු තාක්ෂණ උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය

## 4.2 සේවා පහසුකම් සපයන්නන්ගේ තොරතුරු

**ඩී.එස් පද්මසිරි මහතා**
**අධ්‍යක්ෂ (මුදල්)**
**ශ්‍රී ලං ග සේ (1 ශ්‍රේණිය)**
විද්‍යාවේදී රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය

**ආර්.ඒ.එස්.පී. රණවීර මහතා**
**ලේඛකාධිකාරී,**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා (Ind. Mathematics)
විද්‍යාවේදී (ගෞරව)


**ටී. ඩී. නාරංගොඩ මිය**
**අභ්‍යන්තර විගණක**
ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යාව) කැළණිය විශ්ව විද්‍යාලය
වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාලාව
BBMtg. මානව සම්පත් (විශේෂ)

**බී.ඒ.පී. බාලසූරිය මිය**
**පුස්තකාලයාධිපතිනි**
පුස්තකාල සහ තොතුරු විද්‍යා පශ්චාත් උපාධිය
ශාස්ත්‍රවේදී, කැළණිය විශ්ව විද්‍යාලය
කළමණාකරන ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය


**එස්.එල්. අයි. සමරවික්‍රම මිය**
**සහකාර ලේඛකාධිකාරී**
ශාස්ත්‍රපති (ආර්ථික විද්‍යා) කැළණිය විශ්ව විද්‍යාලය
විද්‍යාවේදී මානව සම්පත් කළමණාකරන විශේෂ උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

# 5. කාර්ය සහ සංවිධාන ව්‍යුහය

## 5.1 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය ව්‍යුහය



## 5.2 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංවිධාන



# 06. අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

## ඉගෙනුම් හා සංවර්ධන වැඩසටහන් - 2019

ඉගෙනුම් හා සංවර්ධන අංශය වනාහී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සියලුම ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන අංශය වේ. එමගින් රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන අවශ්‍යතා සැපිරීම සඳහා අවශ්‍ය වන ඉගෙනුම් හා සංවර්ධන සේවාවන් සැපයේ. මෙය ඉටු කිරීම සඳහාල රාජ්‍ය අංශය තුළ වෙනස් වන නිපුණතා වර්ධන අවශ්‍යතා හා අනුගතව කටයුතු කිරීමට හැකියාව ලබාදෙන ව්‍යුහයක් මෙම අංශය සතු වේ.

රාජ්‍ය අංශයේ සංවිධානයන්හි සහ ඒවායේ කළමනාකරණ කාර්ය මණ්ඩලයන්හි නිපුණතා සංවර්ධනය සඳහා වන පහත ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සිදු කරනු ලබයි.

1. පහත දීප ව්‍යාප්ත සේවාවන්ට බඳවාගත් නවක නිලධාරීන් සඳහා අදාළ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව සේවාරම්භක පුහුණු වැඩසටහන් පැවැත්වීම. (ගාස්තු අය නොකරන පාඨමාලා)
   - i. ශ්‍රී ලංකා පරිපාලන සේවය (ශ්‍රී ලං ප සේ),
   - ii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී ලං ග සේ),
   - iii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (ශ්‍රී ලං ක්‍ර සේ),
   - iv. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (ශ්‍රී ලං වි සේ),
   - v. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය (ශ්‍රී ලං වා වි සේ),
   - vi. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (ශ්‍රී ලං ඉං සේ),
   - vii. ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවය (ශ්‍රී ලං තො ස තා සේ),

2. 1 වන සහ 111 වන පංතියේ මට්ටම් වලදී දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් හට අනිවාර්ය වන ධාරිතා සංවර්ධන වැඩසටහන් (ගාස්තු අය නොකරන වැඩසටහන්)
3. ඩිප්ලෝමා වැඩ සටහන් (ගාස්තු අය කරනු ලබන)
4. කෙටි කාලීන පුහුණු වැඩ සටහන් (ගාස්තු අය නොකරන වැඩ සටහන්)
5. රිසිකරණ පුහුනු වැඩ සටහන් - රාජ්‍ය අංශයේ ආයතන සහ රාජය ව්‍යවසායකත්වයන්හී ඉල්ලීම් මත පදනම්ව (ගාස්තු අය කරනු ලබන පාඨමාලා)
6. කළමණාකරන උපදේශනයන් (ගාස්තු අය කරනු ලබන)
7. අනෙකුත් මූලාරම්භයන් (ගාස්තු අය කරනු ලබන සහ අය කරනු නොලබන වැඩ සටහන්)

## 6.1 සේවාරම්භක පුහුණු වැඩසටහන්

ස්වකීය සේවාවන්හී පෙරටුගාමීන් ලෙස කටයුතු කිරීම පිණිස අවශ්‍ය පුලුල් පරාසයකින් යුත් විෂය කාරණා සහ අනෙක් අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීමේ අරමුණින් දීප ව්‍යාප්ත සේවාවන්ට බඳවා ගනු ලබනා නවක නිලධාරීන් වෙනුවෙන් සේවාරම්භක පුහුණු පාඨමාලා පවත්වනු ලබයි. ප්‍රධාන විෂය කරුණු සම්බන්ධයෙන් වන මොඩියුලයන්ට අමතරව ඌව කුඩාඔය, කොමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ සහභාගීත්වය සහිතව බැහැරගත පුහුණු ආකාරයෙන් පුද්ගල පෞරුෂ සංවර්ධනය පිණිස විශේෂ වැඩ සටහන් මේ පුහුණවට ඇතුලත් කරනු ලබයි. තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා මධ්‍යස්ථානය විසින් ස්වකීය සේවාරම්භක පුහුණුව අතර භාෂා පුහුණුවක් පවත්වන ලදී. ඇතැම් වැඩ සටහන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සහයෙන් ක්‍රියාත්මක කෙරිණි.

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය දීප ව්‍යාප්ත සේවාවන් සඳහා බඳවා ගනු ලැබූ නිලධාරීන් 1159 ක් උදෙසා සේවාරම්භක පුහුණු පාඨමාලා 11 ක් පැවැත්වූ අතර එකී පුහුණු පාඨමාලාවන්හී විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | සේවාව | සහභාගී වූ අයගේ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විවෘත) | 175 |
| 02 | ශ්‍රී ලංකා පරිපාලන සේවය (සීමිත) | 48 |
| 03 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (පළමු කණ්ඩායම) | 214 |
| 04 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (දෙවන කණ්ඩායම) | 30 |
| 05 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (පළමු කණ්ඩායම) | 25 |
| 06 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (දෙවන කණ්ඩායම) | 35 |
| 07 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සේවය (කණ්ඩායම් 5) | 210 |
| 08 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (සීමිත) | 35 |
| 09 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (විවෘත) | 101 |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - අධි ශ්‍රේණිය (සීමිත) | 143 |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - අධි ශ්‍රේණිය (කුසලතා) | 143 |
| | **එකතුව** | **1159** |

## 6.2 දීප ව්‍යාප්ත සේවාවන් සඳහා වන අනිවාර්ය ඉගෙනුම් සහ සංවර්ධන පුහුණු වැඩසටහන්

දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා අවශ්‍ය වන්නාවූ දැනුම, කුසලතා මෙන්ම ආකල්ප අඛණ්ඩව සංවර්ධනය කිරීම මෙන්ම ඔවුන් ඉන් පෝෂණය කිරීම ස්වකීය මුඛ්‍ය වගකීම් අතරින් එකක් බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හඳුනාගනු ලැබ තිබේ.

දීප ව්‍යාප්ත සේවාවන්හී සේවා ව්‍යවස්ථා අනුව එමගින් අදාල සේවාවන්හී නිලධාරීන් හට අනිවාර්ය කර ඇති අවශ්‍යතාවක් වනුයේ සේවාරම්භක පුහුණු පාඨමාලාව සහ ධාරිතා සංවර්ධන වැඩ සටහන් නිසි ලෙස සම්පූර්ණ කිරීමයි.

එහෙයින් මෙකී නිලධාරීන් අතර අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් සුපෝෂණය කිරීම කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සහතික කිරීම උදෙසා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන්නාවූ කරුණකි. ඒ අනුව දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් උදෙසාම පවත්වනු ලබනා මෙකී වැඩ සටහන් පහත සංකල්ප මත පදනම් වේ.

- කලින් කලට අවශ්‍ය වන්නාවූ එසේම විශේෂයෙන් හඳුනාගනු ලැබ ඇති චර්යාමය සහ තාක්ෂණික නිපුණතාවන් සුපෝෂණය
- සීඝ්‍රයෙන් වෙනස්කම් වලට බඳුන් වන්නාවූ පරිසරයක් තුළ වැඩිවෙමින් පවත්නා අභියෝගයන්ට අනුව කටයුතු කරනු පිණිස අවශ්‍ය වන්නාවූ දැනුම සහ කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම.

ඒ අනුවල 2019 වසර තුලදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ එහි නිලධාරීන් 692 කට මධ්‍ය වෘත්තික ධාරිතා සංවර්ධන වැඩ සටහන් පවත්වන ලද අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | සේවය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිවූවන්ගේ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා පරිපාලන සේවය (I ශ්‍රේණිය) | 1 | 16 |
| 2 | ශ්‍රී ලංකා පරිපාලන සේවය (III ශ්‍රේණිය) | 3 | 119 |
| 3 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (Iශ්‍රේණිය) | 6 | 269 |
| 4 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (III ශ්‍රේණිය) | 7 | 273 |
| 5 | ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 1 | 15 |
| | I පන්තිය/ I/ II ශ්‍රේණිය | | |
| | **එකතුව** | | **692** |

1 ශ්‍රේණියෙහි නිලධාරීන් උදෙසා වන ධාරිතා සංවර්ධන වැඩ සටහනට විදෙස් අත්දැකීම් ලබා ගැනීම උදෙසා වන සංචාරයක්ද ඇතුලත් කරන ලදී. මෙකී වැඩ සටහනෙහි අරමුණ වූයේ ස්වකීය ඉගෙනුම් ක්‍රියාවලිය අතර ප්‍රායෝගික ඉගෙනුම් සහ අත්දැකීම් ලබා ගැනීම පිණිස සහභාගිවන්නන් උදෙසා විදෙස් අත්දැකීම් ලබා දීමයි. පුහුණු විෂය මාළාව සහ ක්‍රමවේදය ප්‍රධාන වශයෙන්ම තොරතුරු හුවමාරුව සහ ජාත්‍යන්තර වශයෙන් හොඳම පරිචයන් පිළිබඳ අත්දැකීම් ලබාදීම ඉලක්ක කරමින් ඉලක්කගත කණ්ඩායම සවිබලගැන්වීම උදෙසා වන උපාය මාර්ගයන් මත පදනම්ව පැවතියේය.

ඒ අනුව 2019 වසර තුළදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහිදී ස්වකීය මධ්‍ය වෘත්තික ධාරිතා සංවර්ධන වැඩ සටහන සම්පූර්ණ කර සිටි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 35 දෙනකු, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයෙහි නිලධාරීන් 35 දෙනකු සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 35 දෙනෙකු මැලේසියාවෙහි විදෙස් අත්දැකීම් ලබා ගැනීම පිණිස සංචාරයක නිරත කරවන ලදී.

## 6.3 කුසලතා සංවර්ධන වැඩසටහන - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ වාස්තු විද්‍යාත්මක සේවයේ I, II සහ III ශ්‍රේණි

කළමනාකරණ නිපුණතා සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, වාස්තු විද්‍යාත්මක සේවයේ සහ තාක්ෂණික සේවයේ (I, II සහ III ශ්‍රේණියෙ) නිලධාරීන් සඳහා නිර්මාණය කර ඇති අතර මෙම වැඩසටහනෙහි ඉලක්කය වනුයේ මෙම සේවාවන්ට අදාළව දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීමත් වඩාත් හොඳ සේවාවක් සැපයීම පිණිස එම සේවාවන්හි නිලධාරීන් තුළ ධනාත්මක ආකල්ප ඇති කිරීමත්ය.

| 59 | | තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය පුළුල් කිරීම (සයිබර් කැෆේ) සඳහා වූ ඉංජිනේරු ගාස්තුවල ගෙවීමට ඇති ශේෂය | | 47,070.39 | 47,070.39 |
| 60 | | නේවාසිකාගාරයේ කාමර සඳහා RFID දොර පද්ධතිය සවිකිරීමේ කටයුතුවල කම්කරු ගාස්තු | | 37,450.00 | 37,450.00 |
| | | **මුළු එකතුව** | **45.00** | **34,994,044.04** | **31,557,547.78** |

*** භාණ්ඩාගාරයෙන් අරමුදල් නොලැබීම හේතුවෙන් මෙම කාර්යයන් 2020 අයවැයට කල් දමන ලදී.

# 12. 2019 වසරේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විශේෂ අවස්ථා

## I. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ජනාධිපති පරිසර සම්මාන - 2019 හි රිදී සම්මානය දිනා ගන්නා ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ජනාධිපති පරිසර සම්මාන - 2019 හි රාජ්‍ය ආයතන කාණ්ඩය යටතේ ''රිදී සම්මාන ජයග්‍රාහකයා'' බවට පත් වුණි. මෙම සම්මාන උළෙල 2019 ඔක්තෝම්බර් 29 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ මූලිකත්වයෙන් නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වුණු අතර එය සංවිධානය කරන ලද්දේ මධ්‍යම පරිසර අධිකාරිය විසිනි. ජනාධිපති පරිසර සම්මාන කාණ්ඩ කිහිපයක් යටතේ ප්‍රදානය කරනු ලබයි. සම්මාන සඳහා තෝරාගැනීමේ අතිශය දුෂ්කර ක්‍රියාවලියට සම්භාවනීය විනිශ්චය මණ්ඩලයක් දායක විය. ''ජනාධිපති පරිසර සම්මානය'' පරිසරය පිළිබඳ සවිඥානිකව කටයුතු කිරීමට සමාජයේ සියලු අංශ තුළ පෙලඹවීමක් ඇති කරනු ඇති අතර එතුළින් වඩාත් හරිත ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමට මං පාදනු ඇත.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් දිනා ගන්නා ලද රිදී සම්මානය ආයතනයේ හරිත කණ්ඩායම සමගින් එක්ව හරිතකරණ වැඩසටහනට බෙහෙවින් දායකත්වය සපයන වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්, කුමාරි ජයසේකර මහත්මිය සහ ජ්‍යෙෂ්ඨ උපදේශක, නෙරංජලා ජයසුන්දර මහත්මිය, අධ්‍යක්ෂ (පරිපාලන) ප්‍රසන්න චන්දිත් මහතා සහ සුදත් අල්විස් මහතා විසින් ලබා ගන්නා ලදී.






## II. ශ්‍රී ලංකා පරිපාලන සේවයට අලුතින් බඳවාගන්නා ලද නිලධාරීන් විසින් රචිත පොත් එළි දැක්වීම ඇගයීමට ලක් කිරීම.

ශ්‍රී ලංකා පරිපාලන සේවයට 2019 වසරේදී බඳවාගන්නා ලද නවක නිලධාරීන් අතරින් නිලධාරීන් තිදෙනෙක් ඔවුන් විසින් රචිත පොත් සිය සේවාරම්භක පුහුණු කාල සීමාව තුළදී එළි දැක්වීම මුල්කොට එම නවක නිලධාරීන්ගේ ලේඛන කුසලතා ඇගයීම සඳහා උත්සවයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කරන ලදී. එම වැඩසටහන ශ්‍රී ලං සං පරි ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් කේ. එම්. එස්. ඩී. ජයසේකර මහත්මිය, එහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2019 විවෘත කණ්ඩායමේ සියලුම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ආයතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වුණි. එහි ආරාධිත දේශනය සඳහා සම්මානනීය ලේඛිකා සුමිත්‍රා රාහුබද්ධ මහත්මිය සපැමිණි අතර මෙම නවක නිලධාරීන් විසින් සිදු කරන ලද සාහිත්‍ය නිර්මාණ ඇයගේ ඇගයීමට ලක් විය. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නව කණ්ඩායමට අයත් පහත සඳහන් නවක නිලධාරීන් විසින් තමන් විසින් අලුතින් රචනා කරන ලද පොත් පිළිබඳ ඉදිරිපත් කිරීම් සිදු කරන ලද අතර ඒවා රැස්ව සිටි සම්භාවනීය පිරිසගේ ඉහළ ඇගයීමට ලක් විය.

I. නිමේෂ් තිවංක සෙනෙවිපාල මහතා තමා විසින් රචනා කරන ලද විජය ධරණී සහ කුරුණෑගල විස්තරය යන ග්‍රන්ථ දෙක පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදු කළ අතර මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද එම ග්‍රන්ථ ද්විත්වයට අමතරව ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් වීමට පෙර දළදා මාලිගාවේ සේවය කරමින් සිටියදී තවත් ග්‍රන්ථ 29 ක් රචනා කර තිබේ.

II. වී.තුලන්චලන් මහතා දෙමළ භාෂාවෙන් රචිත සිය අලකිලා අඩල් නම් ග්‍රන්ථය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළේය.

III. මන්දුලී මෙන්ඩිස් මහත්මිය ඉංග්‍රීසි භාෂාවෙන් රචිත සිය Me in My Saree නම් ග්‍රන්ථය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළේය.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් අනාගත පරපුර උදෙසා සාහිත්‍ය කෘති ඉදිරිපත් කළ මෙම නවක නිලධාරීන්ගේ කැපවීම අධ්‍යක්ෂ ජනරාල් තුමිය බෙහෙවින් අගය කළ අතර රට පුරා විවිධ ස්ථානවල රාජකාරි භාරගැනීමෙන් පසු නුදුරු අනාගතයේදී ඔවුන්ට මුහුණ දීමට සිදුවන කාර්යබහුල දිවිය මධ්‍යයේ වුවද මෙවැනි ක්‍රියාකාරකම්වල අඛණ්ඩව නිරත වන මෙන් ඔවුන්ට උපදෙස් දුන්නාය. තවද ඔවුන් සිය ග්‍රන්ථ එළි දැක්වීම සිදු කළේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කිසිදු සහායක් නොපතමින් බවද සඳහන් කළ ඇය ඔවුන්ගේ ධෛර්යය සහ කැපවීම අගය කළ අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලයේ සියලුදෙනා වෙනුවෙන් ඔවුන්ට සුභ පැතුවාය.

නවක කතුවරුන් විසින් තම ග්‍රන්ථ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුස්තකාලය වෙත ප්‍රදානය කරන ලදී.







### III. කාර්ය මණ්ඩලයේ වර්ෂ අවසාන විශ්ලේෂණාත්මක සාකච්ඡාව - විවේකී හමුව (Retreat) 2019

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විවේකී හමුව – SLIDA Retreat වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ නායකත්වය යටතේ සියලුම අධ්‍යයන සහ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ඇතිව 2019 ඔක්තෝම්බර් 18, 19 සහ 20 යන දිනවලදී කුකුළේ ගඟ Laya Leasure හිදී පැවැත්වුණි.

මෙවැනි විවේකී හමුවක් කිසියම් ආයතනයක කාර්ය මණ්ඩලයට සිය ආයතනයේ දෛනික කටයුතුවලින් බැහැරව එම ආයතනයේ අනාගතය සහ සාකච්ඡා කළ යුතු විශේෂිත ගැටළු පිළිබඳ අවධානය යොමු කර පුළුල් ලෙස සාකච්ඡා හා සංවාද පැවැත්වීමටත් උපායමාර්ගික වශයෙන් කල්පනා කිරීමටත් එතුළින් නිගමනයන්ට එළඹීමටත් ඉඩ සැලසෙන හොඳම අවස්ථාවකි. ඒ සමගම කාර්ය මණ්ඩලයට සිය කාර්යබහුල රාජකාරිවලින් මිදී මඳ විවේකයක් ගැනීමට මෙය අවස්ථාවක් වන අතර සේවාවන් සැපයීමේදී ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න හා ගැටළු සාකච්ඡා කිරීමටත් ඒවාට නිසි විසඳුම් සොයා ගැනීමටත් ඉන් ඔවුන්ට ඉඩ සැලසේ. මෙය ඔවුන් තුළ කණ්ඩායම් හැඟීම වැඩි දියුණු කරන අතර සියලුදෙනා ඒකීය මෙහෙවරක් වටා එක් රොක් කරමින් එලඹෙන වසර සඳහා ඉලක්ක තීරණය කිරීමට අවස්ථාවක් සලසයි.








### IV. අප ආ ගමන් මග

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ඉතිහාසය පිළිබඳ සකස් කරන ලද අප ආ ගමන් මග නම් ලේඛනය ජ්‍යෙෂ්ඨ අධ්‍යයන උපදේශිකා, සීතා විතානාරච්චි මහත්මිය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් කුමාරි ජයසේකර මහත්මිය වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පරිශ්‍රයේදී 2019 සැප්තැම්බර් 12 වන දින පිළිගන්වන ලදී.



### V. ශ්‍රී ලංකා පොලිසියේ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සඳහා කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන

නියෝජ්‍ය පොලිස්පතිවරුන් සඳහා කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ පස් දින පුහුණු වැඩසටහනක් 2019 ජූලි 29 දින සිට අගෝස්තු 02 වන දින දක්වා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී පැවැත්විණි. අභිප්‍රේරණය, අධීක්ෂණය, නායකත්වය, සන්නිවේදනය, පාරිභෝගික සේවා යනාදිය මෙම පාඨමාලාවේ අන්තර්ගතයට ඇතුළත් විය. මෙම වැඩසටහන තුළදී කළමනාකරණය හා සම්බන්ධ හොඳම පරිචයන් සහ අදාළ සිද්ධාන්ත සකස් කිරීමටත් අවබෝධ කරගැනීමටත් ඔවුන්ට හැකියාව ලබාදෙමින් ප්‍රයෝගික අත්දැකීම් ලබාගැනීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලදී.

මෙම වැඩසටහනෙහි කැඳවුම්කරු කේ. එම්. එස්. ඩී. ජයසේකර මහත්මිය වූ අතර ජ්‍යෙෂ්ඨ උපදේශකයින් කණ්ඩායමක සහාය ඇයට ලැබිණි.



## VI. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංවර්ධන නිලධාරීන් සඳහා රිසිකරණ පුහුණු වැඩසටහන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සංවර්ධන නිලධාරීන් සඳහා කළමනාකරණය සහ නායකත්වය පිළිබඳ දින 10 ක රිසිකරණ පුහුණු වැඩසටහනක් 2019 ජූලි 29 දින සිට අගෝස්තු 9 වන දින දක්වා පවත්වන ලදී. පුහුණු වැඩසටහන සම්පූර්ණ කිරීමෙන් අනතුරුව නිලධාරීන් වෙත සහතික පත්‍රයක් ප්‍රදානය කරන ලදී.




## VII. "ප්‍රායෝගික භාවිතාව තුළ නායකත්වය"යන මැයෙන් ප්‍රසිද්ධ දේශනය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසල මගින් සංවිධානය කරන ලදුව ''ප්‍රායෝගික භාවිතාව තුළ නායකත්වය'' යන මැයෙන් ප්‍රසිද්ධ දේශනයක් විශ්‍රාමික ජනරාල් දයා රත්නායක මහතා විසින් 2019 ජූලි 11 වන දින පෙරවරු 08.30 සිට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ''සන්කථනි'' ශාලාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා යුධ හමුදාවේ විශ්‍රාමික ජනරාල්වරයෙකු වන රත්නායක මහතා ජනරාල් නිලයට උසස් වීමට පෙර යුධ හමුදාව තුළ ඉහළ නිලයන් රැසක් දරා තිබේ. යුධ හමුදාව තුළ සිය සේවා කාලය තුළදී, ජනරාල් රත්නායක මහතා විදේශ අධ්‍යයන සංචාර රැසක් ලබා ඇති අතර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා සාකච්ඡාවලටද සහභාගී වී තිබේ. මෙම සංචාර සහ ශ්‍රී ලංකාවේදී ලද සිය අත්දැකීම් තුළින් උදාහරණ ගණනාවක් උපුටා දක්වමින් නායකත්වයේ ගුණාංග හා ශෛලීන් සහ නායකයෙකු විසින් ඒ ඒ අවස්ථා මත පදනම්ව තීරණ ගත යුත්තේ කෙලෙසද යන්න ඔහු පැහැදිලි කළේය.




## VIII. ශ්‍රී ලංකා පරිපාලන සේවයට අලුතින් බඳවාගත් නිලධාරීන් සඳහා සමාජ ඒකාබද්ධතාව පිළිබඳ පදනම් පාඨමාලාව

ශ්‍රී ලංකා පරිපාලන සේවයට 2019 වසරේදී බඳවාගත් නිලධාරීන් කණ්ඩායමේ සේවාරම්භක පුහුණුවේ කොටසක් වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි මූල්‍යමය හා තාක්ෂණික සහාය ඇතිව සමාජ ඒකාබද්ධතාව පිළිබඳ මාර්ගගත පාඨමාලාවක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වන ලදී. මෙය අලුතින් හඳුන්වා දෙන ලද විෂයයක් වූ අතර මහ ජනතාව වෙත සේවය සැපයීමේදී අර්බුදකාරී අවස්ථාවන් කළමනාකරණය කරගැනීම සඳහා පහත අංශ වෙත විශේෂ අවධානය යොමු කරමින් ඔවුන් පුහුණු කරන ලදී.

සමාජ ඒකාබද්ධතාව යන්නෙහි නිර්වචනය : සමාජය එක් ඒකකයක් වශයෙන් එකට පවත්වාගැනීමයි. පවුල, ආයතනය, ප්‍රජාව, රට, ආගම සහ ලෝකය සමාජය යනුවෙන් හඳුනා ගනු ලැබේ.

තවද සමාජ ඒකාබද්ධතාව යන්නට ඇතුළත් වන දෑ වශයෙන් සමානාත්මතාව, සහභාගීත්වය, ඇතුළත් වීම, සම්බන්ධිත බව, සියලුදෙනාගේ යහපත සහ අයත් බව වශයෙන් හඳුනා ගැනේ.

මෙම පාඨමාලාව සඳහා මාර්ග ගත මොඩියුල 3 ක් තිබුණු අතර එයට සහභාගි වූ නිලධාරීන්හට 1 වන මොඩියුලය මගින් අදාළ සංකල්පය, එහි සංරචක සහ සම්බන්ධතා පිළිබඳද 2 වන මොඩියුලය මගින් අනන්‍යතාව යනු කුමක්ද යන්න හා අනන්‍යතාව නිර්මාණය වන්නේ කෙසේද යන්නත් ගැටුම් යනු කුමක්ද යන්න හා ගැටුම් පිළිබඳ සංවේදීතාව යනු කුමක්ද යන්න පිළිබඳද 3 වන මොඩියුලය මගින් සමාජ ඒකාබද්ධතාව මනින ආකාරයත් ප්‍රයෝගික මට්ටමෙන් සමාජ ඒකාබද්ධතාව යොදා ගනු ලබන ආකාරය හා සමාජ ඒකාබද්ධතාව සම්බන්ධ උදාහරණ හදුනා ගන්නා ආකාරයත් පිළිබඳව සම්පූර්ණ දැනුමක් ලබා ගැනීමට හැකි විය.

ඉහත සියලු පැතිකඩ පිළිබඳ දැනුවත් භාවයක් ලබාදීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පාඨමාලා ඇගයුම් සැසි වාරයක් සහ සමාප්ති වැඩමුළුව 2019 ජුනි 7 වන දින වෝටර්ස් එජ්හිදී පවත්වන ලදී. එම වැඩසටහන දිනය පුරා පැවැත්වුණු අතර නිලධාරීන් 173 දෙනෙක් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කොට සහතික පත්‍ර ලබා ගෙන ඇත. එම ඇගයුමේදී මොඩියුල අඛණ්ඩව ඉගැන්වීමට පුහුණු වන ලද බාහිර සහ අභ්‍යන්තර පහසුකම් සලසන්නන් විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි උපදේශකයින් සමග එක්ව නවක නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කරන ලදී.



## IX. රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2018

2019 ජුනි 04 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයන පාසලේ 06 වන රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහභාගී විය. මෙදින උපාධිධාරීන් 144 දෙනෙක් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගත්හ. විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් රාජ්‍ය පරිපාලන සහ ආපදා කළමනාකරණ ගරු අමාත්‍ය රංජිත් මද්දුම බණ්ඩාර මහතා මෙම අවස්ථාවට සහභාගී වූ අතර පාලක සභාවේ සභාපති සහ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යංශයේ ලේකම් ජේ.ජේ.රත්නසිරි මහතාද එම අවස්ථාවට එක් විය.





## X. “දැනුම, සීමාවෙන් ඔබ්බට.. Knowledge Beyond Boundaries...”

2019 අප්‍රේල් 04 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී ශ්‍රී ලංකා රජයේ ඉ - ඉගෙනුම් පෝටලය දියත් කරන ලදී.

මෙමගින් සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන සහ අඛණ්ඩ ඉගෙනුම් අවශ්‍යතා සැපිරීම සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.





## XI. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පළමු වතාවට ඵලදායිතා ජයග්‍රහණයක් අත් කර ගැණිනි.

2019.03.26 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ජාතික ඵලදායිතා සම්මාන උළෙලේදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය නිෂ්පාදන හා සේවා කාණ්ඩයේ තුන්වන ස්ථානය දිනා ගත්තේය.




## XII. මෙරට පළමු වතාවට රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් සඳහා පරිපාලන නීතිය පිළිබඳ නවතම ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් හඳුන්වා දෙන ලදී

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2019.10.29 දින රාජ්‍ය පරිපාලනල කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතාගේ සහභාගීත්වය ඇතිව රාජ්‍ය/ පුද්ගලික අංශයේ නිලධාරීන් සඳහා පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 හි සමාරම්භය සිදු කරන ලදී. මෙම අවස්ථාවට එක්වූ සම්භාවනීය ආරාධිත අමුත්තන් අතර ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් සහ පාලක සභාවේ සාමාජික ගාමිණී සෙනෙවිරත්න මහතා සහ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම් ඩබ්. එච්. කරුණාරත්න මහතා වූහ.

එම උත්සවය අමතමින් ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා, රාජ්‍ය නිලධාරියෙකුට සිය එදිනෙදා නිල රාජකාරි ඉටු කිරීමේදී අත්දැකීමට සිදුවන දෑ පිළිබඳ සැබෑ ජීවිතයේ උදාහරණ දක්වමින් නෛතික දැනුම සහ කුසලතා අදාළ කරගැනීමේ හැකියාව සහ එහි අවශ්‍යතාව අවධාරණය කර සිටියේය. එමෙන්ම නෛතික පසුබිම පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබීම නීති හා රෙගුලාසි අර්ථ කථනය කිරීම සඳහාද උපකාරී වන බව ඔහු අවධාරණයෙන් කියා සිටියේය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පිරිනමනු ලබන මාස හයක ඩිප්ලෝමා පාඨමාලාවක් වන මෙය නීතිය හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිළිබඳ නිපුණත්වයක් ලබා ගැනීමටත් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම නීති විෂයයෙහි සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමෙහි නිපුණ රාජ්‍ය අංශයේ විධායක නිලධාරියෙකු වශයෙන් කටයුතු කිරීමටත් අවශ්‍ය දැනුම සහ විශේෂිත කුසලතාවලින් එය හදාරන පිරිස සන්නද්ධ කිරීම සඳහා නිර්මාණය කර තිබේ.

ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ නිලධාරීන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පරිපාලන නීතිය පිළිබඳ ඩිප්ලෝමාව ප්‍රදානය කෙරේ. මෙම පාඨමාලාව සම්බන්ධීකරණය කරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨ උපදේශිකා, නීතිඥ රෝෂණී දිසානායක මහත්මිය විසිනි.









## XIII. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සහ කැනඩාවේ සෙනෙකා ව්‍යවහාරික කලා හා තාක්ෂණ විද්‍යාලය අතර සහයෝගීතාව

පසුගිය වසරේ මැයි මාසයේදී දකුණු ආසියානු Seneca International හි අධ්‍යක්ෂ ප්‍රශාන්ත් ශ්‍රීවස්ටාවා මහතා Seneca සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යාපනික හවුල්කාරීත්වයන් ගවේෂණය කරමින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සමග සාකච්ඡා පවත්වා ඇත. මෙම මූලාරම්භයේ ප්‍රතිඵලයක් වශයෙන් 2019 ජනවාරි 14 වන දින Seneca කණ්ඩායම ශ්‍රී ලංකාවට පැමිණියේය.

කැනඩාවේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛ පෙළේ පශ්චාත් ද්විතීය අධ්‍යාපන ආයතනයක් වන සෙනෙකා ව්‍යවහාරික කලා හා තාක්ෂණ විද්‍යාලයේ සභාපති David Agnew මහතා සහ Seneca විද්‍යාලයේ සභාපතිවරයාගේ කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී Renata D'Innocenzo මෙය හා දකුණු ආසියානු Seneca International හි අධ්‍යක්ෂ ප්‍රශාන්ත් ශ්‍රීවස්ටාවා මහතාගෙන් සමන්විත කණ්ඩායම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත පැමිණියහ.





## XIV. පාකිස්ථානයේ පුහුණු වැඩසටහන

ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගීත්වය ඇතිව පාකිස්ථානයේ අග්‍රාමාත්‍යවරයාගේ උසස් අධ්‍යාපන සහයෝගිතා වැඩසටහන යටතේ සම්පාදනය කරන ලද මෙම වැඩසටහන 2019 සැප්තැම්බර් 16 වන දින සිට 27 වන දින දක්වා ලාහෝර්හි රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජාතික පාසලේ විධායක සංවර්ධන ආයතනයේදී පැවැත්වුණි. ශ්‍රී ලංකාවේ සිවිල් සේවකයින්ට ඉතා වැදගත් වන්නා වූ විෂයය ක්ෂේත්‍ර ගණනාවක් මෙම වැඩසටහන මගින් ආවරණය කෙරිණි. එහිදී සිදුවූ වැදගත්ම හමුවක් වූයේ ඉස්ලාමාබාද්හි පිහිටි ජනාධිපති කාර්යාලයේදී පාකිස්ථානයේ අතිගරු ජනාධිපතිවරයා මුණ ගැසීමයි. එහිදී ඔහු වර්තමානයේ සිවිල් සේවකයින්ගේ කාර්යභාරය සහ රටක සංවර්ධනයට එහි ඇති බලපෑම පිළිබඳ අවධාරණ කළේය.




## XV. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා උෟව කුඩා ඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේදී පවත්වන ලද බැහැර ගත පුහුණුව

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා නායකත්වය සහ කණ්ඩායම් ගොඩනැංවීම පිළිබඳ පුහුණු වැඩ සටහනක් 2019 මාර්තු 15 සිට 17 දක්වා උෟව කුඩා ඔය කමාන්ඩෝ පුහුණු පාසලේදී සංවිධානය කර තිබුණිග මෙම වැඩසටහන සඳහා GIZ මගින් අරමුදල් සම්පාදනය කෙරුණු අතර ශ්‍රී ලංකා පරිපාලන ආයතනයේ කාර්ය මණ්ඩලයේ විවිධ මට්ටම්වලින් සහභාගී වූ නිලධාරීන් 70 දෙනෙක් වෙනුවෙන් වූ පරිපූර්ණ බැහැරගත පුහුණු වැඩසටහනක් සඳහා සියලු කටයුතු සම්පාදනය කිරීම අණ දෙන නිලධාරී කර්නල් කේ.එච්.එම්.එස්. වික්‍රමරත්න සහ ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකාරක මේජර් චමින්ද සමරසිංහ විසින් සිදු කෙරිණි. එම පුහුණු වැඩසටහන සංවිධානය කර තිබුණේ නායකත්ව ගුණාංග හා තීරණ ගැනීමේ හැකියාවන්, ශාරීරික යෝග්‍යතාව හා පරිසර ආරක්ෂාව සහ ආහාර ගැනීමේ චාරිත්‍ර විධි යනාදිය වැඩි දියුණු කෙරෙන ආකාරයටය. ඉහත අරමුණු ඉලක්ක කරමින් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්හට විවිධ මට්ටම්වල කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට ඉඩ ප්‍රස්ථාව සලසා තිබුණි.



## 13. විගණන කමිටුවේ වාර්තාව

PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1. ඡේදය ප්‍රකාරව, වර්තමානයේදී සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ පද්ධතිය, අභ්‍යන්තර ක්‍රියාවලිය හා බාහිර විගණනයේ විගණන ගැටළුවලට ප්‍රතිචාර දැක්වීම, අභ්‍යන්තර හා බාහිර විගණකගේ සොයාගැනීම් සහ නිර්දේශ, ස්වාධීනත්වය සහ කාර්ය සාධනය මෙන්ම නීති හා රෙගුලාසි සහ පොදු කාර්ය ප්‍රතිපත්ති හා අනුකූල වීම අවේක්ෂණය කිරීමේ ආයතන ක්‍රියාවලිය යනාදියේ අවංකභාවය සහතික කිරීම සඳහා ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීමට පාලක සභාවට සහාය වේ.

# විගණන හා කළමනාකරණ කමිටුව

### සංයුතිය සහ රැස්වීම්

විගණන හා කළමනාකරණ කමිටුව පාලක සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් (03) හා එක් ස්වාධීන නිරීක්ෂකයකුගෙන් සමන්විත වේ.
2019 වසර සඳහා පාලක සභාව විසින් පත් කරන ලද විගණන කමිටුවේ සාමාජිකයන් පහත පරිදි වේ :

- පී.බී.එස්.සී. නෝනිස් මහතා — අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
- කමල් පත්මසිරි මහතා — ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය (පත්වීම් කාල සීමාව - 2016 ඔක්තෝම්බර් සිට 2019 මාර්තු දක්වා)
- එම්. එම්. පී. කේ. මායාදුන්නේ මහතා — ලේකම්, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යංශය.
- ගාමිණී කේ. බී. රත්නායක මහතා — පාලක සභා සාමාජික, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

2019 දෙසැම්බර් 31 වනදායින් අවසන් වූ වර්ෂය සඳහා කමිටුවේ ලේකම් වශයෙන් ආයතනයේ අභ්‍යන්තර විගණක කටයුතු කළේය. එම වසර තුළ විගණන කමිටු රැස්වීම් 2 ක් පැවැත්වුණු අතර විගණන කමිටු රැස්වීම් වාර්තා පාලක සභාව වෙත නිතිපතා යොමු කරන ලදී. රජයේ සිදු වූ වෙනස්කම් හේතුවෙන් 03 වන හා 04 වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නොපවත්වන ලද අතර ආයතනය සඳහා පාලක මණ්ඩල සාමාජිකයින් නම් නොකර තිබීම එයට හේතුවයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු වන විගණන අධිකාරී එම්.ආර්.ආර්.කේ. මල්ලව මෙය මෙයට නිරීක්ෂකයෙකු වශයෙන් සහභාගී වේග එයට අමතරව, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට නිරීක්ෂයෙකු වශයෙන් සහභාගී වේ. විශේෂ කාරණාවලදී විගණන කමිටුව වෙත උපදෙස් ලබාදීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ආරාධනා කෙරිණි.

### සමුද්දේශ විෂය

අංක PED 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පාලක සභා සාමාජිකයින් විසින් ඉදිරිපත් කර ඇති නියත සමුද්දේශ විෂයය මගින් කමිටුව පාලනය වේ. සමුද්දේශ විෂයය සහ රජයේ අවශ්‍යතාවලට අනුකූලව තම වගකීම් ඉටු කිරීමේදී පහත අරමුණු කෙරෙහි කමිටුව අවධානය යොමු කරයි.

අ. අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිර්ණය කිරීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය.
ආ. අස්තිත්වයේ සියලු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධතීන් සමාලෝචනය සහ ඇගයුම.
ඇ. පිරිවැය ඵලදායිතාව සඳහා සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම යනාදිය සඳහා නියත කාල අන්තරවලදී කාර්යසාධනය සමාලෝචනය කිරීම.
ඈ. බාහිර විගණකයින් සමග සම්බන්ධීකරණය ඇති කරගැනීම සහ විගණකාධිපතිගේ /බාහිර විගණකයින්ගේ කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් පසු විපරම සිදු කිරීම.
ඉ. ව්‍යවස්ථා, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ අනුකූල වන බව නිශ්චය කිරීම.
ඊ. ගිණුම්කරණ ප්‍රමිති හා අනුගත වන්නේද යන්න සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
උ. අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කොට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම.
ඌ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.
එ. කමිටුව විසින් සැලකිල්ලට ගත යුතු, ක්‍රියාවට නැංවිය යුතු හෝ වැඩි දියුණු කළ යුතු දෑ වශයෙන් හඳුනාගනු ලැබූ ඕනෑම කාරණයක් පාලක සභාව වෙත වාර්තා කිරීම.
ඒ. වාර්ෂික වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා කමිටුවේ සොයාගැනීම් පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම.

## මූල්‍ය වාර්තාකරණය

පාර්ශ්වකරුවන් වෙත සැපයෙන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. ගිණුම් පොත් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා පාලක සභාව සතු වන වගකීම ඉටු කිරීමට කමිටුව පාලක සභාවට සහාය වෙයි. සියලු ගණුදෙනු නිවැරදිව හා සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල වාර්තා වන බවට සාධාරණ සහතිකයක් සැපයීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පරිපාටීන්වල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

කමිටුව විසින් සියලුම ත්‍රෛමාසික විගණනය නොකළ අතුරු මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන ලද වැදගත් උපකල්පන හා විනිශ්චයන් ඇතුළත් වූ උපකාරක තොරතුරු සමාලෝචනය කරන ලදී.

## අභ්‍යන්තර පාලන

විගණන කමිටුව විසින් 2019 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය වාර්තාකරණයේදී අභ්‍යන්තර පාලනයේ ඇති ඵලදායී බව තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය මගින් අභ්‍යන්තර පාලන කටයුතුවල සහ නීති හා රෙගුලාසි සමග අනුගත වීම සහතික කිරීම සඳහා පවතින අවදානම් පාලනය කිරීමේ ක්‍රියාවලිවල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව තක්සේරු කරනු ලබයි. අභ්‍යන්තර විගණකයින් විසින් ලබාදෙන නිර්දේශ මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ඵලදායී බව වැඩි දියුණු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම මගින් පාලක සභාව වෙත එහි කාර්යයන් අඛණ්ඩව සිදු කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා හැකියාව ලබාදේ.

## අභ්‍යන්තර විගණනය

විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වල අභ්‍යන්තර විගණන කටයුතු ස්වාධීනව සිදු කෙරෙන බවත් අපක්ෂපාතීව හා නිසි වෘත්තීමය අයුරින් සිදු එය සිදු කෙරෙන බවත් විගණන කමිටුව සහතික කරයි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, වපසරිය සහ ඵලදායී බව විගණන කමිටුව විසින් අධීක්ෂණය හා සමාලෝචනය කරන ලදී.

**පී.බී.එස්.සී. නෝනිස්**
**සභාපති**
**විගණන හා කළමනාකරණ කමිටුව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EHA/C/FS/SLIDA/03/2019/11

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 අගෝස්තු 13 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිත කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව උපචිත වියදම් අයිතම 05 ක වටිනාකම වූ රු. 2,519,794 ක් සහ රු.406,790 ක් වූ ලැබිය යුතු ආදායම් අයිතම 03 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 නියමයන්ට අනුකූලව රු. 32,383,494 ක පොලී ආදායම හා රු. 25,802 ක මූල්‍ය වියදම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර, කෙරීගෙන යන වැඩ සඳහා ගෙවන ලද රු. 1,644,344 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු. 1,150,386 ක පාරිතෝෂික ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ආයතනයේ ස්ථාවර වත්කම් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වගන්තිය අනුව අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය නොකිරීම නිසා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. මිලියන 196 විය. එසේ වුවත් එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වෙනත් පරිභෝජනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකමින් රු. 216,197 ක බැර ශේෂයක් අඩුකර දක්වා තිබීම හේතුවෙන් සැපයීම් ද්‍රව්‍ය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර, පෞද්ගලික ආයතන දෙකකට ගෙවිය යුතු රු. 545,645 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන හා ක්ෂය ගණනය කිරීමේ උපලේඛන සැසඳීමේදී ස්ථාවර වත්කම් අයිතම 07ක රු.15,537,607ක වෙනසක් නිරීක්ෂණය විය.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

3

NAOSL ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 3 (අ) හි සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීති රීති, විධිවිධානවලට යොමුව** | **විස්තරය** |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත | |
| i. 16 (2) වගන්තිය | විධිවිධාන ප්‍රකාරව ආයතනයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. 38 (ආ) වගන්තිය | සේවාරම්භක හා අනෙකුත් පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන නිලධාරීන්ගෙන් ඒ ඒ පුහුණු වැඩසටහන |

6

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| | | සම්බන්ධව ලබා ගන්නා ප්‍රතිපෝෂණපත් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (ආ) | 2010 ජූලි මස 09 දිනැති අංක CA/1/1/16/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ ලිපිය | විදේශගත වන රාජ්‍ය නිලධාරීන් දිවයිනට පැමිණීමෙන් පසු චක්‍රලේඛ ආකෘතිය ප්‍රකාරව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී විදේශගත වූ ආයතනයේ නිලධාරීන් 07 දෙනෙකු විසින් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | අතුරු අග්‍රිමයන් අදාළ කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 44 කදී ලබාගත් රු. 2,498,440 ක් වූ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට දින 19 ක සිට දින 119 ක් අතර කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය. |
| (ඈ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ ආරම්භක ලැබිය යුතු ශේෂ රු. 330,000 ක් හා පෙර වර්ෂවලදී භාෂා අංශයේ ලැබිය යුතු ලෙස අධි තක්සේරු කරන ලද රු. 478,011 ක් පාලක සභා අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. |
| (ඉ) | 2003 ඔක්තොම්බර් 28 දිනැති අංක PED/17 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිලධාරින් විදේශ ගත වීමට ප්‍රථම රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක ජනරාල්ගෙන් අනුමැතිය ලබා ගත යුතු නමුත් නියැදි පරීක්ෂාව අනුව අවස්ථා 07 ක දි නිලධාරීන් 07 කු අදාල අනුමැතිය විදේශගත වීමට පෙර ලබා ගෙන නොතිබුණි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.31,228,496 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන අනුව ලේඛනයක් පවත්වා ගැනීම හෝ සකස්කර ඇති ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතුකර නොතිබුණි. |

7

| | |
|---|---|
| (උ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය | දිරිදීමනා පටිපාටිය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු නමුත් එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී රු.6,041,471 ක්ද 2018 වර්ෂයේදී 7,469,067 ක් හා 2019 වර්ෂයේ දී රු. 2,380,148ක් වශයෙන් ආයතනයේ කාර්ය මණ්ඩලයේ 95 දෙනෙකු වෙත දිරි දීමනා ගෙවා තිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  1982 අංක 09 දරන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය පිහිටුවීමේ පනතේ ආයතනයේ අරමුණක් හෝ කාර්යභාරයක් නොවන සහ ආයතනයේ පුහුණු වැඩ සටහන්වලට අදාළ නොවන කාර්යක්ෂමතා කඩඉම් විභාග 37ක් ප්‍රවර්තන වර්ෂය තුලදී පවත්වා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

-----------------------------

(අ) උපචිත වියදම් ගිණුමේ පසුගිය වර්ෂ කිහිපයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකළ රු. 1,994,507 ක ශේෂයට අදාලව තව දුරටත් වගකීමක් නොමැති නම් ආදායමට ලියා හැරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනික 2013 අප්‍රේල් 19 දිනැති අංක අමප/13/0237/523/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ද්විතියන අධ්‍යයන කාර්යමණ්ඩලය වෙත සියයට 50 ක ද්විතියන දීමනාවක් ගෙවා තිබුණි. එය ගෙවීම සඳහා 2014 නොවැම්බර් 14 දිනැති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග අනුව මාසිකව ඉටුකල යුතු අවම පැය ප්‍රමාණය පැය 45 ක සීමාව වෙත

8

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලභාවිය යුතු බව දක්වා තිබුණි. එම නියෝගයට පටහැනිව, ආයතනය වෙත 2015 ජූලි සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා අය කරගත යුතු රු. 9,152,375ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා අයකරගත යුතු මුදල විගණිත දිනය දක්වා ගණනය කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේ දී "සංධරණී" පර්යේෂණ මධ්‍යස්ථානය රු. 3,443,672 ක් වැයකර නවීකරණය කර තිබුණු අතර, පර්යේෂණ මධ්‍යස්ථානයේ ගෘහ භාණ්ඩ, පරිගණක හා අනෙකුත් විද්‍යුත් උපකරණ උපයෝජනය නොකර නිෂ්ක්‍රියව පවතින බව භෞතිකව පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

(ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 වගන්තිය අනුව ලංසු විවෘත කිරීමේ වගකීම ප්‍රසම්පාදන කමිටුව සතුවන අතර ප්‍රසම්පාදන කමිටුවට එහි අධිකාරිය කමිටුව විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත ලංසු විවෘත කිරීමේ කමිටුවකට පැවරිය හැක. එසේ වුවත් ආයතන පරිශ්‍රය වටා පිහිටි යකඩ වැට නවීකරණය කිරීමට අදාල ලංසු විවෘත කර තිබුණු කමිටුව ප්‍රසම්පාදන කමිටුව විසින් පත් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති